රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 13/2010

මගේ අංකය :- EST-7/LEAVE/03/3125
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය,
නිදහස් චතුරස්‍රය,
කොළඹ 07.

2010.08.04

අමාත්‍යාංශ ලේකම්වරුන්,
පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්,
දෙපාර්තමේන්තු ප්‍රධානීන් සහ
රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්.

**2010 රමලාන් (රමසාන්) සමයේදී විශේෂ නිවාඩු ලබා දීම**

මෙවර රමලාන් (රමසාන්) සමය 2010 අගෝස්තු 12 දින ආරම්භ වී 2010 සැප්තැම්බර් 10 දින අවසන් වීමට නියමිත බැවින් එම කාලසීමාව තුළදී මුස්ලිම් නිලධාරීන්ට / සේවකයින්ට යාඥ සහ ආගමික වතාවත්වල නිරත විය හැකි වන පරිදි වැඩ පිළිවෙලක් සකස් කරන ලෙස ඉල්ලා සිටිනු ලැබේ.

02. යාඥ සහ ආගමික කටයුතු දිනපතා සිදුකෙරෙන කාල වේලාවන් පහත දක්වෙන පරිදි වේ.

* පෙරවරු 03.30 සිට පෙරවරු 06.00 දක්වා
* පස්වරු 03.15 සිට පස්වරු 04.15 දක්වා
* පස්වරු 06.00 සිට පස්වරු 07.00 දක්වා
* පස්වරු 07.30 සිට පස්වරු 10.30 දක්වා

03. හැකි සෑම අවස්ථාවකදීම එම නිලධාරීන්ට / සේවකයින්ට ආගමික වතාවත්වල යෙදීමට හැකිවන පරිදි වැඩ මුර සකස් කර දිය යුතුය. නොවැලැක්විය හැකි අවස්ථාවලදී පමණක් විශේෂ නිවාඩු අනුමත කිරීම මැනවි.

04. රමලාන් (රමසාන්) අවසන් වීමට දින 14 කට කලින් රාජ්‍ය සේවයේ, රාජ්‍ය සංස්ථා හා ව්‍යවස්ථාපිත මණ්ඩල වල සුදුසුකම් ඇති මුස්ලිම් නිලධාරීන්ට / සේවකයින්ට උත්සව අත්තිකාරම් ලබාදීමටද කරුණාකර කටයුතු කරන්න.

ඩී. දිසානායක
ලේකම්
රාජ්‍ය පරිපාලන හා ස්වදේශ
කටයුතු අමාත්‍යාංශය